*සැ. යු.*- (i) 2016.07.22 දින පළ වූ අංක 1,977 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2016 වර්ෂය සඳහා පොළොන්නරුව අධිකරණ කලාපයට අයත් ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,978 - 2016 ජූලි මස 29 වැනි සිකුරාදා - 2016.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1144 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - අමීර් අලි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මැයි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1143 - B 81083 — 5,403 (2016/07)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරට බඳවා ගැනීම - 2016

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *මාසික වැටුප් ප්‍රමාණය* : මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව රු. 25,250-10x270-10x300-10x330-12x350-රු. 38,450 වේ.

2. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකි ය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය.

3. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| බද්ධකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතු ය. (එකවර විෂයයන් පහක් (05) සමත් වී තිබීම අනිවාර්ය වේ.) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක පැළ බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ අවම වශයෙන් මාස 06ක පුහුණුවක් ලබා තිබිය යුතු අතර, ඒ බව සහතිකයකින් සනාථ කළ යුතු ය. (සහතිකය වලංගු දිනය 2016.08.19 දිනට පෙර විය යුතු ය.) |

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.08.19 වේ. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

5. අනෙකුත් සුදුසුකම් :

*(අ)* අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය ;
*(ආ)* මනා චරිතයකින් යුක්ත විය යුතු ය ;
*(ඇ)* මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය ;
*(ඈ)* 2016.08.19 දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

6. *සේවා කොන්දේසි*.- මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

7. *බඳවා ගැනීමේ ක්‍රමය*.- සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

8. *අයදුම් කිරීමේ ක්‍රමය*.- මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016.08.19 දින හෝ එදිනට පෙර ''ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.), තැ. පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2016'' යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී හෝ නියමිත සුදුසුකම් සපුරා නොමැතිව හෝ අසම්පූර්ණව ඉදිරිපත් කෙරෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාළ කරුණු

හෝ එම නිවේදනයේ ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2016**

01. *(අ)* මුලකුරු සමග නම :..........................................................................................................................................

*(ආ)* මුලකුරු වලින් හැඳින්වෙන නම් :..........................................................................................................................

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................................................

02. ස්ථිර ලිපිනය :..........................................................................................................................................................

03. රාජකාරී ලිපිනය :....................................................................................................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :........................................................

05. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...............................................................................................

*(ආ)* දුරකථන අංක : පෞද්ගලික :............................................... රාජකාරී :................................................

06. *(අ)* උපන් දිනය : වර්ෂය :..........................., මාසය :.........................., දිනය :...........................

*(ආ)* 2016.08.19 වැනි දිනට වයස : අවුරුදු :.........................., මාස :...................., දින :......................
(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)

07. *අධ්‍යාපන සුදුසුකම් :*

විභාගයේ නම හා වර්ෂය :......................................................................................................................

| *සමත් වූ විෂයයයන් :* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |
| | .............................. | ........................................ |

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

08. *වෘත්තීය සුදුසුකම් :*

වෘත්තීය පුහුණුව ලබාගත් ආයතනය :..........................................................................................
පුහුණු කාල සීමාව :..........................................................................................

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

09. පළපුරුද්ද ඃ

*(අ)* සේවය කළ/කරන ආයතනයේ නම ඃ....................................................................................................................................

*(ආ)* සේවා කාලය ඃ.................................................................................................................................

(ලිපි මගින් සනාථ කළ යුතු ය.)

10. ...............................................................................................................වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති කිසියම් හෝ තොරතුරක් සාවද්‍ය යැයි මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරවම දනිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය ඃ.................................

..............................................

අයදුම්කරුගේ අත්සන.

11. *දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

....................................................... මහතා/මහත්මිය/මෙනවිය .................................... වැනි දින සිට ................................ ආයතනයේ .................................................. වශයෙන් සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත්, සඳහන් කරමි.

.................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා
දින මුද්‍රාව.

දිනය ඃ.................................

07-1073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.